මගේ අංකය / எனது இல. / My No. SGLG/RT/A/BLPS/FA/A$_2$/05/2023/10
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2024 අප්‍රේල් 10 දින.

ලේකම්,

බලංගොඩ ප්‍රාදේශීය සභාව.

**බලංගොඩ ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(I) උපවගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

බලංගොඩ ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව ඉදිරිපත් කළයුතු මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට බලංගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාවට අයත් රු.3,300,000ක් වටිනා ඉඩමක් ප්‍රාග්ධනිත නොකිරීම හේතුවෙන් ජංගම නොවන වත්කම් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුම එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ ස්ථාවර වත්කම් වැඩිදියුණු කිරීම සඳහා වැයකරන ලද රු.424,424ක් මෙහෙයුම් වියදම් ලෙස ගිණුම්ගත කර තිබීමෙන් වර්ෂයේ මෙහෙයුම් අතිරික්තය එම වටිනාකමින් අඩුවෙන් දැක්වුණි. එමෙන්ම, එම වියදම ප්‍රාග්ධනිත කර නොතිබීම හේතුවෙන් ජංගම නොවන වත්කම් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුම සමාන වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) ගලි බවුසරයේ වටිනාකම රු.1,700,000ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබීම හේතුවෙන් ජංගම නොවන වත්කම් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුම එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළ මිලදීගත් රු.72,100ක් වටිනා යන්ත්‍ර හා උපකරණ ප්‍රාග්ධනිත කර නොතිබීම හේතුවෙන් ජංගම නොවන වත්කම් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුම එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළ ස්ථාවර තැන්පතු ආයෝජන වටිනාකම රු.2,000,000ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ ගැලපීම හේතුවෙන් ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය එම වටිනාකමින් වැඩියෙන් හා මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය එම වටිනාකමින් අඩුවෙන් දැක්වුණි.

(ඊ) එකතුව රු.21,590,902ක් වූ ගිණුම් විෂයයන් 02ක විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

(104)

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූෂසන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි අංක 371(2)ආ | සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 15කදී ලබා දී තිබුණු රු.590,200ක අත්තිකාරම් පියවීම දින 16ත් 93ත් අතර කාලයක් ප්‍රමාද වී තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 371 (5) | 2013 වර්ෂයේ ලබාදී තිබුණු රු.93,423ක අත්තිකාරම් 05ක් පියවා නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 571 | 2019 වර්ෂයේ සිට 2021 වර්ෂය අතර කාලයට අදාළ රු.296,506ක රඳවුම් මුදල් නිරවුල් කර නොතිබුණි. |
| (ආ) ආයතන සංග්‍රහයේ XIV වැනි පරිච්ඡේදයේ 12.3 වගන්තිය | ස්ථිර දීමනාවක් ලබන නිලධාරියෙකුට ආණ්ඩුවේ වාහනයක් නොමිලයේ පාවිච්චි කිරීමට හිමිකමක් නොමැති වුවද, සභාවේ හිටපු ලේකම් විසින් පරිවර්තිත දීමනාව ලබා ගනිමින් රාජකාරී සඳහා රජයේ වාහන ද භාවිතා කර තිබුණි. |

103

| | | |
|---|---|---|
| (ඇ) | 2017 ජූලි 25 දිනැති අංක 02/2017 දරන ජාතික අයවැය චක්‍රලේඛය | නිමවුම් දර්ශක හා ප්‍රධාන කාර්යසාධන දර්ශක හඳුනාගෙන නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.26,568,497ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.10,267,713ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,378,380 | 1,056,755 | 1,099,099 | 98,842 | 1,378,381 | 1,083,059 | 1,030,861 | 134,681 |
| කුලී | 9,229,800 | 7,064,969 | 5,893,135 | 20,400 | 9,091,650 | 6,222,837 | 5,934,426 | 86,057 |
| බලපත්‍ර ගාස්තු | 901,250 | 1,140,010 | 1,026,240 | - | 905,500 | 881,370 | 896,120 | - |
| වෙනත් ආදායම් | 15,941,800 | 13,745,036 | 14,512,826 | - | 5,489,500 | 11,573,436 | 10,908,834 | - |
| | 27,451,230 | 23,006,770 | 22,531,300 | 119,242 | 16,865,031 | 19,760,702 | 18,770,241 | 220,738 |

සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට හිඟ ආදායම රු.220,738ක් වූ අතර, වර්ෂයේ බිල්කිරීම් රු.23,006,770ක් විය. ඒ අනුව වර්ෂය තුළ රැස්කළ යුතු සමස්ථ ආදායම රු.23,227,508ක් වුවද, රැස් කරන ලද ආදායම රු.22,531,300ක් වීමෙන් තවදුරටත් රැස්කර ගතයුතු ආදායම සමස්ථ ආදායමේ ප්‍රතිශතයක් ලෙස සියයට 03ක මට්ටමක පැවැතිණි.

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

-------------------------------------

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම, රැස්කළ ආදායම සමඟ සැසඳීමේදී බලපත්‍ර ගාස්තු, වරෙන්තු හා දඩ සහ වෙනත් ආදායම් යන ආදායම් විෂයයන්ගේ රැස්කළ ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා 14කින්, 22කින් හා 17කින් වැඩි වී තිබුණු අතර, වරිපනම් හා බදු, බදු කුලී ආදායම, සේවා සඳහා ගාස්තු සහ රජයේ දායකත්වය යන ආදායම් විෂයයන්ගේ රැස්කළ ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 20කින්, 36කින්, 26කින් හා 17කින් අඩු වී තිබුණි.

### 2.2.3 වරිපනම් හා බදු

------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.40,587ක් වූ හිඟ වරිපනම් බදු ශේෂය තුළ වසර 03කට වඩා වැඩි කාලයක සිට පැවැත එන ඒකක 42කින් අයවිය යුතු රු.19,844ක් ඇතුළත් වී තිබුණි. එම හිඟ ශේෂ අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.53,750ක් වූ හිඟ අක්කර බදු ශේෂය තුළ වසර 03කට වඩා වැඩි කාලයක සිට පැවැත එන ඒකක 108කින් අයවිය යුතු රු.50,378ක් ඇතුළත් වී තිබුණි.

### 2.2.4 වෙනත් ආදායම්

-----------------

2008 ජනවාරි 07 දිනැති අංක 153/6 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද වාහනවල බර සහ වේගය සීමා කිරීම හා ධාවනය විධිමත් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව අනුව 2021 වර්ෂයේදී නිකුත් කර තිබුණු ප්‍රවාහන බලපත්‍ර 09ක් හා 2023 අගෝස්තු මස නිකුත් කර තිබුණු එක් බලපත්‍රයක් සඳහා රු.20,699ක් අඩුවෙන් අයකර තිබුණි.

### 2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.3,926,479ක් විය.

2.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2005 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ සිදුකරන ලද ඉඩම් කට්ටි කර විකිණීම් අවස්ථා 25කින් එම ඉඩම්වල තාවකාලික තක්සේරුව මත එකතුව රු.3,024,188ක් අයකර තිබුණ ද, එකී ඉඩම් කට්ටිවල තථ්‍ය විකුණුම් වටිනාකම මත අයවිය යුතු ඉතිරි මුදල අයකරගෙන නොතිබුණි.

(ආ) මායිම් තාප්ප 02ක සැළසුම් අනුමත කිරීමේදී පෙරසැරි ගාස්තු රු.33,854ක් අඩුවෙන් අයකර තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

3.1 කාර්යසාධනය

-----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුව විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

------------------------------

සභා බල ප්‍රදේශය තුළ එකතුවන දිරන කසළ එකතු කර කොම්පෝස්ට් ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා 2022 වර්ෂයේදී රු.4,868,664ක් වැය කර වැලිපතයාය කසළ අංගනය ඉදිකර තිබුණද, 2023 වර්ෂය අවසන් වන විටත් එහි කටයුතු ආරම්භ කර නොතිබුණි. එමෙන්ම, නොදිරන කසළ මධ්‍යස්ථානය සඳහා 2022 ජූලි මස පරිත්‍යාග ලෙස ලද රු.950,000ක් වටිනා බෙලර් යන්ත්‍රය ද නිෂ්කාර්යයව පැවැතිණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

---------------------------------

2021 මාර්තු 09 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ අංක 01/2021 දරන චක්‍රලේඛයේ අංක 09 වගන්තියට පටහැනිව අනුමත කාර්යය මණ්ඩලය ඉක්මවා සේවයේ යොදවා තිබුණු පෙර පාසල් පාලිකාවන් දෙදෙනෙකු වෙත 2021 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ රු.1,062,000ක් දීමනා ගෙවා තිබුණි.

## 3.3 වත්කම් කළමනාකරණය

### වාහන උපයෝජනය

2015 මැයි මාසයේදී පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් පරිත්‍යාගයක් ලෙස ලැබී තිබුණු FOTON ට්‍රැක්ටර් රථය ලද දින සිට නිෂ්කාර්යව පැවැතිණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### අයවැය පාලනය

පහත සඳහන් කරුණු හේතුවෙන් වාර්ෂික අයවැය මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි.

(අ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 05කට අදාළව එකතුව රු.907,000ක් වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 10කට අදාළව එකතුව රු.72,914,000ක් වූ මුළු ප්‍රතිපාදනයෙන් සියයට 50 සිට සියයට 99 දක්වා පරාසයක ඉතිරිවීම තිබුණි.

ටී.පී.එම්. කුමානායක.

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති,

විගණකාධිපති වෙනුවට.